මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය-2015

Primary Piriven Year End Term Test - 2015

4 ශ්‍රේණිය/Grade 4

භූගෝල විද්‍යාව

Geography

කාලය : පැය 03 යි.

Time : Three hours.

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

I වන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

(01) (අ) **සපයා ඇති ලංකා සිතියමෙහි පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.**

i. කොළඹ දිස්ත්‍රික්කය.
ii. දෙවුන්දර තුඩුව.
iii. මඩකලපුව.
iv. ත්‍රිකුණාමල වරාය.
v. මහවැලි ගඟ.
vi. මන්නාරම් දූපත.
vii. පුත්තලම් කලපුව.
viii. පෝර්ක් සමුද්‍ර සන්ධිය.
ix. කොඩ්ඩියාර් බොක්ක.
x. වැද්දා කන්ද.

(ලකුණු 1 x 10 = 10)

(ආ) **පහත සඳහන් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.**

i. දේශගුණික අංග දෙකක් නම් කරන්න.
ii. ශ්‍රී ලංකාවට වැසි ලැබෙන ක්‍රම දෙකක් නම් කරන්න.
iii. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප දෙකක් නම් කරන්න.
iv. වායු ගෝලයේ ප්‍රධාන වායු වර්ග දෙකක් නම් කරන්න.
v. වායු ගෝලයේ ඕසෝන් ස්ථරය පිහිටා ඇත්තේ කුමන කොටසෙහි ද?
vi. ජලයෙන් ඇති ප්‍රයෝජන දෙකක් දක්වන්න.
vii. වනාන්තර විනාශ වන ක්‍රම දෙකක් දක්වන්න.
viii. ලංකාවේ ගංවතුර තර්ජනයට ලක්වන දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න.
ix. 1:50 000 මෙට්‍රික් සිතියම්වලදී පාසල හා රෝහල ඉදිරිපත් කරන සම්මත සංකේත දක්වන්න.
x. ග්‍රිනිච් රේඛාවේ සහ ජාත්‍යන්තර දින රේඛාවේ දේශාංශ අගය දක්වන්න

(ලකුණු 1 x 10 = 10)

(02) i. ජල චක්‍රය රූප සටහනකින් ඇඳ එහි ප්‍රධාන අවස්ථා නම් කරන්න.

(ලකුණු 08)

ii. ජලය දූෂණය වන ක්‍රම තුනක් නම් කොට ජලය සංරක්ෂණය කළ හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ලකුණු 12)

(03) i. ඉතා වටිනා ස්වාභාවික සම්පත් කිහිපයක් නම් කරන්න.

(ලකුණු 08)

ii. එම ස්වාභාවික සම්පත් ඉක්මණින් ක්ෂය වීමට හේතු සහ ඒවා සංරක්ෂණය කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග විස්තර කරන්න.

(ලකුණු 12)

(04) i. වනාන්තරවලින් ඇති ප්‍රයෝජන දක්වන්න.

(ලකුණු 08)

ii. ශ්‍රී ලංකාවේ වනාන්තර සංරක්ෂණය කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග විස්තර කරන්න.

(ලකුණු 12)

(05) i. විදේශීය සංචාරකයින් ලංකාවට පැමිණීමෙන් ලැබෙන වාසි නම් කරන්න.

(ලකුණු 08)

ii. සංචාරක කර්මාන්තයේ දියුණුවට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ලකුණු 12)

(06) i. ශ්‍රී ලංකාවේ දැකගත හැකි ප්‍රයෝජනවත් ඛනිජ වර්ග නම් කරන්න.

(ලකුණු 08)

ii. ඛනිජ කැනීමෙන් සිදුවන පරිසර හානි නම් කොට එම හානි වළක්වා ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ලකුණු 12)

(07) i. කාලගුණය හා දේශගුණය හඳුන්වන්න.

(ලකුණු 08)

ii. කාලගුණික වෙනස්වීම් කෙරෙහි මානවයාගේ ක්‍රියාකාරකම් සිදුකරන බලපෑම විස්තර කරන්න.

(ලකුණු 12)

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/ இலங்கைப் பரீட்சைத் திணைக்களம்/ Department of Examinations, Sri Lanka

මූලික පිරිවෙන් අවසාන විභාගය

විභාග අංකය
சுட்டெண்
Index No. ........................................

